# පුරාතන ශ්‍රී ලාංකේය කෘෂිකර්මාන්තය හා සබැඳි අභිචාර විධි පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

**කේ. ඒ. ඉෂාරා අංජලී ද අල්විස් ගුණසේකර**

සහය කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය.
Isharagunasekara123456@gmail.com

## හැඳින්වීම

මානව ශිෂ්ටාචාරයේ මූලාරම්භයේ සිටම මිනිසා තම ජීවිකාව පවත්වාගෙන යාම සඳහා විවිධ ආර්ථික ක්‍රියාකාරකම්හි නියැලී තිබේ. එම ක්‍රියාකාරකම් පදනම් කරගත් මිනිසාගේ එක් ප්‍රධාන ජීවිකාවක් වූයේ කෘෂිකර්මාන්තයයි. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය පිළිබඳව අවධානය යොමු කිරීමේදී ලෝකයේ අනෙකුත් සමාජයන්හිදී මෙන් ශ්‍රී ලංකාවේත් පුරාතනයේ සිටම පැවත එන අභිචාර, සිරිත් විරිත් හා පුද පූජා පද්ධතියක් පැවති බව පෙනේ.

ස්වභාවික පරිසරය හා බැඳිදන, ගැටෙන මිනිසා මුහුණදුන් නොයෙක් ආකාරයේ ජීවන ගැටලුවලට හා සිය අවශ්‍යතාවයන් තෘප්ත කර ගැනීමට විවිධ වූ විශ්වාසයන් පදනම් කර ගනිමින් ඇදහිලි, වත්පිළිවෙත් රාශියක් සිදු කරන ලද අතර ඒවා පොදුවේ අභිචාර යනුවෙන් හිඳුනා ගනු ලැබේ. විශේෂයෙන්ම පුද්ගලයාට හා තම කටයුතුවලට අහිමත බොහෝ උවදුරුවලට හේතුව තේරුම් ගැනීමට ප්‍රාථමික මානවයාට නොහැකි වීම හේතුවෙන් ඔවුහු සිය දැනීම හා බුද්ධි මට්ටම අනුව පරිසරය, සමාජය හා ඒවායේ ක්‍රියාකාරකම් තේරුම් ගැනීමට උත්සහ ගෙන තිබේ. එහිදී අත්දකින්නට ලැබුණු හා අවබෝධ කර ගත නොහැකි වූ ස්වභාවික සංසිද්ධීන් අද්භූත බලවේග ලෙසින් සැලකූහ. මෙවැනි නොයෙක් විශ්වාසයන් හා මතිමතාන්තරවලින් පණ පෙවුණු මනෝභාවයන් හා වත්පිළිවෙත් සමුදායක් 'අභිචාර' යනුවෙන් සමාජ මානව විද්‍යාඥයෝ හිඳුනා ගෙන ඇත. මෙලෙස මිනිසාට පාලනය කර ගත නොහැකි තත්ත්වයන් සමුදායක් යහපත් ආකාරයෙන් විසිදා ගැනීම සිදහා අභිචාර විධීන් රැසක් පුරාතන ශ්‍රී ලාංකේය කෘෂිකර්මාන්තය තුළ සිදු කරන ලදී.

## අරමුණ

මෙම සන්දර්භය තුළ ප්‍රස්තුත පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වනුයේ ප්‍රාථමික මූලාශ්‍රයන් ඇසුරු කර ගනිමින් ශ්‍රී ලාංකේය කෘෂික සමාජය හා බැඳිදන අභිචාර විධීන් පිළිබිඳ ඓතිහාසික විමර්ශනයක් කිරීමය. ඊට අමතරව ගොවිතැනේදී භාවිත කළ අභිචාර විධීන් හිඳුනා ගැනීම මෙන්ම එම අභිචාර, සිරිත් විරිත් හා පුද පූජා ආදිය මිගින් පාරම්පරික ගොවියා පරිසර හිතෛෂී ලෙස කටයුතු කළ ආකාරය පිළිබිඳ විමර්ශනය කිරීමත්ය.

## ක්‍රමවේදය

ඉහතින් දැක්වූ පර්යේෂණයේ මුඛ්‍ය අරමුණු සාධනය කර ගැනීම සහ ඒවාට අදාල තොරතුරු එක් රැස් කර ගැනීම සිදහා ඉස්මතු කරන පර්යේෂණ ගැටළුව වනුයේ, පුරාතන ශ්‍රී ලාංකේය කෘෂිකර්මාන්තය තුළ අනුගමනය කළ අභිචාර විධි මොනවාද යන්නත්, ඒ පිළිබිඳ තොරතුරු ප්‍රාථමික මූලාශ්‍ර ඇසුරින් අනාවරණය කර ගත හැක්කේ කෙසේද යන්නත්ය. විශේෂයෙන්ම මෙම පර්යේෂණය සිදු කර ගෙන යාමේදී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර පරිශීලනය කිරීමට සිදුවිය. එමෙන්ම මේ හා සම්බන්ධව මෙතෙක් ලියා පළ කරන ලද ලිපි ලේඛන ආදියත් මේ සම්බන්ධයෙන් තොරතුරු රැස් කිරීමේදී වැදගත් විය. මෙකී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රගත තොරතුරු හා ප්‍රස්තුත මාතෘකාවට අදාළව මෙතෙක් ලියා පළ

කරන ලද ලිපි ලේඛන ආදිය ඒකරාශී කරමින් විචාරයට බඳුන් කිරීම තුළින් තොරතුරු ලබා ගැනීමේ ක්‍රමවේදයක් පර්යේෂණ ක්‍රමවේදය ලෙස මෙහිදී යොදා ගනු ලැබේ.

**සාකච්ඡාව**

හෙළ ගොවිතැන හා සම්බන්ධ අභිචාර විධි පිළිබඳ පර්යේෂණ කිහිපයක් විවිධ වූ විෂය පථයයන් යටතේ එළිදක්වා තිබේ. ඉන්ද්‍රකීර්ති සිරිවීර මහතා විසින් 1993 වර්ෂයේදී රචිත **ශ්‍රී ලංකාවේ කෘෂි ඉතිහාසය**, මැදඋයන්ගොඩ විමලකීර්ති හිමියන් විසින් 2002 වර්ෂයේදී රචිත **සිංහල ගොවිතැන**, 1998 වර්ෂයේදී ඇස්.පී.සමරසිංහ මහතා විසින් පරිවර්තනය කරන ලද එච්.සී.පී. බෙල් මහතා විසින් ලියන ලද **පහතරට වී ගොවිතැන හා සම්බන්ධ සිංහල ව්‍යවහාර සහ චාරිත්‍ර විධි** නැමති කෘතිය හා උබයසේකර දිසානායක විසින් 2010 වර්ෂයේදී රචිත **අභිචාර** යන කෘතීන් ඒ අතරින් කිහිපයකි. එම පර්යේෂණ කෘතිවලදී ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳවත්, අභිචාර විධි පිළිබඳවත්, අභිචාර වර්ගීකරණය පිළිබඳවත්, කෘෂිකර්මාන්තය හා බැඳුණු අභිචාර සිරිත් විරිත් පිළිබඳවත් ආදී ක්ෂේත්‍ර රැසක් පිළිබඳ සාකච්ඡා කර තිබේ. නමුත් මෙම පර්යේෂකයන් විටෙක සමාජ විද්‍යාත්මකව හා මානව විද්‍යාත්මක කර දෘෂ්ටියකින් මේ පිළිබඳ අවධානය යොමු කර තිබීම හේතුවෙනුත් මෙම පර්යේෂණ අතරින් බොහොමයක්ම ප්‍රාථමික මූලාශ්‍ර පරිශීලනයකට වඩා ද්විතීයික මූලාශ්‍ර පරිශීලනය ඔස්සේ රචනා කර ඇති බැවිනුත් එහිවූ ඓතිහාසික පාර්ශවය අනාවරණය වන බවක් දක්නට නොලැබේ. එසේම ආර්ථික නිෂ්පාදන ක්‍රියාවලිය තුළදී විශේෂයෙන් පැරැන්නන් විසින් සිය කෘෂි කටයුතුවලදී අනුගමනය කළ මෙම අභිචාර, සිරිත් විරිත්, වත්පිළිවෙත් ආදී අගනාකම් පද්ධතිය හේතුවෙන් ශ්‍රී ලාංකේය සමාජයට ද සිදුවූ බලපෑම ඉමහත්ය. (ආගමික, ආර්ථික, සමාජයීය හා සංස්කෘතික වශයෙන්) නමුත් ඒ පිළිබඳ තතු එම පර්යේෂණ තුළින් ඉස්මතු නොවීම ද අඩුපාඩුවක් ලෙස පෙනේ. එබැවින් මෙවැනි හිස් අවකාශයන් තරමක් දුරට හෝ සම්පූර්ණ කරමින් පුරාතන ශ්‍රී ලාංකේය කෘෂිකර්මාන්තය තුළ භාවිත අභිචාර පිළිබඳව ඓතිහාසික දෘෂ්ටියෙන් නිදසුන් සහිතව තොරතුරු විවරණය කිරීමට මෙහිදී අපේක්ෂිතය.

මෙකී අරමුණු, ක්‍රමවේද ඔස්සේ පර්යේෂණය කර ගෙන යාම මගින් ඓතිහාසිකමය වශයෙන් වැදගත් පාර්ශව කිහිපයක් කෙරේ අවධානය යොමු කිරීමට අපේක්ෂිතය. ඒ අතර ප්‍රාථමික තාක්ෂණික ක්‍රමයන් භාවිත කරන ලද සමයක කෘෂිකාර්මික කටයුතුවලදී ගොවියාට පාලනය කර ගත නොහැකිවූ අභියෝගාත්මක සන්සිද්ධීන්ට (සත්ත්ව උවදුරු, ජල ගැලීම්, නියඟ ආදී) ප්‍රතිචාර දක්වනු වස් අභිචාර විධීන් උපයෝගී කර ගත් ආකාරය පිළිබඳව, ගොවිතැනේදී සිදු කළ අභිචාර, සිරිත් විරිත් හා පුද පූජා ආදිය මගින් ශ්‍රී ලාංකේය ගොවියා සිය දැනුමට අනුකූලව පරිසර හිතෛෂී ලෙස වගා කටයුතු සංවිධානය කර ගත් ආකාරය පිළිබඳව, ඇදහිලි, විශ්වාසයන් හා සිරිත් විරිත් පිළිබඳ ඉතිහාසය තුළ අභිචාර සංකල්පයට හිමිවන වැදගත්කම, අභිචාර හා ආගම අතර ඇති සම්බන්ධය, පුරාතන මිනිසුන් අතර පැවති පාරලෞකික විශ්වාස පිළිබඳව, සිංහල සමාජයට ආවේණික විශ්වාස පද්ධතියත් එය ඔවුන්ගේ දෛනික ජීවිතයට සමීපව පවතින ආකාරයත් හා ශ්‍රී ලාංකේය සංස්කෘතියේ අනන්‍යතාවය වටිනාකම ආදි අංශ ඉන් කිහිපයකි.

ඒ අනුව මෙම ප්‍රශ්නතය තුළින් ඉස්මතු වන තොරතුරු අනුසාරයෙන් පුරාතනයේදී පුළුල් පරාසයකට සීමා වී තිබූ සමාජ සබඳතා හේතුවෙනුත් සිය ජීවිතය හා පරිසරය දෙස ප්‍රායෝගිකව බැලීමට තරම් බුද්ධියක් නොවූ පුරාතන ගැමියන් සිය ගොවිතැන් කටයුතුවලදී විවිධ වූ වත්පිළිවෙත්, සිරිත් විරිත් ආදිය සිදු කර වගා කටයුතුවලදී තමාට මුහුණදීමට සිදුවූ අභියෝගාත්මක සංසිද්ධීන් හා බලවේග යහපත් ලෙස මගහරවා ගැනීමට කිසියම් දුරකට හෝ සමත්ව ඇතැයි යන්නත් එමගින් ගොවියාගේ මුඛ්‍ය පරමාර්ථයවූ ශස්‍ය සම්පත්තිය (වැඩි එලදාවක් ලබා ගැනීම) ඉෂ්ට සිද්ධ කර ගෙන ඇති බවත් හා හෙළ ගොවිතැන උතුම් කොට සලකා සියලු කටයුතු කර ඇති බවත් යන අනුමිතියට එළඹීමට හැකි වෙතැයි අපේක්ෂා කෙරේ.

## ආශ්‍රය ග්‍රන්ථ


අමරසේකර, දයා, 2004, "අභිචාරඃ ප්‍රභවය සහ ස්වභාවය පිළිබඳ සමාජ මානව විද්‍යාත්මක හැදින්වීමක්," සාර්ථී (දෙවන වෙළුම), සංස්ඃ උදේනි පත්මනන්ද දිසානායක ඇතුලු තවත් අය, මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව, මහනුවර, පිටු.95-107.

දිසානායක, උබේසේකර, 2010, අභිචාර, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ

බෙල්, එච්.සී.පී, පරිඃ ඇස්.පී.සමරසිංහ, 1998, පහතරට වී ගොවිතැන හා සම්බන්ධ ව්‍යවහාර හා චාරිත්‍ර විධි, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු අමාත්‍යංශය, කොළඹ.

විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ, 2002, සිංහල ගොවිතැන, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

සිරිවීර ඉන්ද්‍රකීර්ති, 1993, කෘෂි ඉතිහාසය, ඇම්.ඩී ගුණසේන සහ සමාගම, කොළඹ.